# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
# கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
# DEPARTMENT OF COOPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephon: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ.இ.419, இல. 330, யூனியன் ப்ளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපෑල / மின்அஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல / My No: ස.සං.දෙ./බැංකු/2/4

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2023.04. 06

**චක්‍රලේඛ - බැ/නි/ජ/2023/02**

සියළුම මූල්‍ය සේවා සමුපකාර සමිති සහ

සංගම්වල ගරු සභාපතිවරුන් වෙත,

**සමුපකාර මූල්‍ය සේවා සමිති සහ සංගම් විසින් සාමාජිකයන් වෙත ප්‍රදානය කරන ණය මුදල් සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක් සැකසීම පිළිබඳව කටයුතු කළ යුතු ආකාරය.**

1. හැඳින්වීම

   - මෙම චක්‍රලේඛයේ අරමුණ වන්නේ මූල්‍ය අතරමැදිකරණයේ නිරත සමුපකාර මූල්‍ය සේවා සමිති සහ සංගම් සඳහා සිය ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීම පිණිස ණය රක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම වේ.

2. ණය රක්ෂණ යෝජනා ක්‍රමයේ නාමය

   "ශ්‍රී ලංකා සමුපකාර මූල්‍ය සේවා සමිති සහ ග්‍රාමීය බැංකු සඳහා වන ණය රක්ෂණ යෝජනා ක්‍රමය"

   "Credit Insurance Scheme for Co-Operative Financial Societies and Co-Operative Rural Banks"

3. අවශ්‍යතාව

   I. ණය රක්ෂණ ක්‍රමයේ අවශ්‍යතාව

      I. ණයකරුවන්ගේ අභාවය හෝ පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීම නිසා ණය වාරික අයකර ගැනීම අපහසු වූ අවස්ථාවල එම ණය වාරික ගෙවීම සඳහා මෙම රක්ෂණ ක්‍රමයේ අරමුදල් උපයෝගී කර ගනු ඇත.

      II. ඉහත අංක I යටතේ දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් පමණක් මෙම රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුලින් ප්‍රදානිත ණය මුදල් අක්‍රමික ගණයට මාරු වීම සහ ඒ හේතුවෙන් බොල් සහ අඩමාණ ණය වෙන් කිරීම සිදු වීමෙන් සමිති / සංගම්වල ලාභදායීත්වය අඩු වීමට ඇති ඉඩකඩ වළක්වා ගත හැක.

III. සමුපකාර මූල්‍ය සේවා සමිති සහ සංගම් විසින් සිය සාමාජික ප්‍රජාවට ප්‍රදානිත ණය සහ අත්තිකාරම්, ආශ්‍රිත සාමාජිකයන් සඳහා ප්‍රදානිත භාණ්ඩ ණය නිසි පරිදි එකඟ වූ ආකාරයට අයකර ගැනීමට නොහැකි වීමෙන් පැන නගින මූල්‍ය අවදානම් අවම කර ගැනීම.

IV. අක්‍රමික ණය ඇති වීමෙන් සමිතිවල පැන නගින තිරසාරත්වයට හානිකර තත්ත්වය සඳහා ස්වාරක්ෂකයක් ලෙස මෙම අරමුදල ස්ථාපිත කිරීම.

4. ණය රක්ෂණ යෝජනා ක්‍රමයේ ක්‍රියාත්විතය

4.1. ණය මුදල් ප්‍රදානය කිරීමේදී ණයකරුවන්ගෙන් ලබාගන්නා කොන්දේසි පිළිබඳ එකඟතා ලිපියකට මෙම අරමුදලට දායක කරන ආකාරය පිළිබඳව ලිඛිත එකඟතාවක් ලබා ගත යුතු ය.

4.2. ණය මුදල සඳහා රක්ෂණ වාරිකයන් තීරණය කිරීමේ දී ණය මුදලේ වටිනාකමින් 0.7% සිට 1.0% දක්වා ප්‍රමාණයන්ගෙන් අය කර අරමුදලට බැර කළ යුතු ය.

4.3. ණයකරුගේ අභාවය හෝ පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වන අවස්ථා වලදී හිඟ ණය ශේෂය අයකිරීම සඳහා මෙම අරමුදලේ ශේෂය භාවිතා කරමින් අනුක්‍රමයෙන් ණය මුදලේ වාරික සහ පොළිය පමණක් අය කළ යුතු අතර, කිසිදු විටෙක ණය මුදලේ මුළු ශේෂය එකවර අය නොකරනු ඇත. මෙම ක්‍රමය තුළින් අරමුදලේ ශේෂය අඩු වීමේ ප්‍රවණතාවය සැලකිය යුතු අන්දමින් කළමනාකරණය කල හැකි වේ.

5. අරමුදල් කළමනාකරණය

- අරමුදල් කළමනාකරණය සඳහා සාමාජිකයන් 05 දෙනෙකුගෙන් යුත් " භාර කමිටුවක් " විසින් සිදු කරනු ඇත. එහි කමිටුව සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලයේ / කාරක සභාවේ සාමාජිකයින් දෙදෙනෙක් හා විධායක නිළධාරීන් දෙදෙනෙක්ගෙන් සමන්විත විය යුතු වේ.

6. ගිණුම් තැබීම හා මෙහෙයුම් කටයුතු

- නිකුත් කළ මුළු ණය වටිනාකමින් 0.7% - 1.0% ත් අතර වටිනාකමක් ණයකරුගෙන් අය කර ණය රක්ෂණ අරමුදලට බැර කළ යුතු ය. එම අරමුදලට මාසිකව බැර වන ශේෂය මාසය අවසානයේ දී රාජ්‍ය බැංකුවක ඉතුරුම් ගිණුමකට මාරු කළ යුතු අතර, එම ගිණුමේ ශේෂය සමුච්චය වීම අනුව රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කල යුතු ය. මෙම ගිණුමේ ශේෂය මත ණය ලබා ගැනීමකට හෝ වෙනත් එවැනි කාර්යයක් සඳහා භාවිතා නොකළ යුතු ය.

- එම ස්ථාවර තැන්පතුව සඳහා වන පොළිය ද එම ගිණුමට ම බැර කළ යුතු ය.

- එක් එක් සමිතිය විසින් වෙන වෙනම රක්ෂණ අරමුදල් ගිණුමක් පවත්වාගෙන යා යුතු අතර, මෙම අරමුදල් වෙනත් කිසිදු කටයුත්තකට උපයෝගී නොකර ගත යුතු ය.

- ණය රක්ෂණය සඳහා දායක මුදල් අය කර ගැනීම -

| | | |
|---|---|---|
| මුදල් ගිණුම | හර | |
| ණය රක්ෂණ අරමුදල් ගිණුම | | බැර |

- රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම -

| | | |
|---|---|---|
| ණය රක්ෂණ අරමුදල් ගිණුම | හර | |
| සාමාජික ණය ගිණුම (වාරිකය) | | බැර |
| ණය පොළී ආදායම් ගිණුම (වාරික පොළිය) | | බැර |

7. විගණනය, සුපරීක්ෂණය සහ අධීක්ෂණය

- ගිණුමේ මෙහෙයුම් කටයුතු සමිතියේ අභ්‍යන්තර විගණක විසින් දෛනිකව විගණනය කර නිවැරදිභාවය තහවුරු කරගත යුතු ය. මෙම විගණක වාර්තාව මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලීය විගණක කමිටුවට ඉදිරිපත් කල යුතු ය.
- මෙම අරමුදල් ශේෂය හා ඊට අනුරූපී වූ ආයෝජන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ.
- දැනට සමිති සහ සංගම් වල පවත්නා මෙවැනි රක්ෂණ ගිණුම්වල ශේෂයන් මෙම නව ගිණුමට මාරු කල යුතු ය.

මෙම චක්‍රලේඛය පිළිබඳ මූල්‍ය සේවා සමුපකාර සමිති / සංගම්වල කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමත් සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය මෙම චක්‍ර ලේඛය අනුව කටයුතු කිරීමත් සිදුකල යුතුබව අවධාරණය කරමි.

**ඩී.ජීවනාදන්,**

සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ

සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.

පිටපත්

| | |
|---|---|
| 1. අධ්‍යක්ෂක ජනරාල් ( ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ) | - කරු.දැ.පි |
| 2. දෙපාර්තමේන්තුවේ සියළුම මාණ්ඩලික නිලධාරීන් | - කරු.දැ.පි හා අ.ක.ස |
| 3. සමුපකාර සමිති අධීක්ෂණ නිලධාරීන් | - කරු.දැ.පි හා අධීක්ෂණ කටයුතුවල දී අවදානය යොමු කිරීම සඳහා |
| 4. විගණන නිලධාරීන් | - කරු.දැ.පි හා වාර්ෂික විගණනයේදි අවධානය යොමුකිරීම සඳහා |